SINHALI

# මූලික ප්‍රතිපත්තිය

**The Co-operative Office for Call & foreigners Guidance at Sultanah**

Under the supervision of Ministry of Islamic Affairs and Endowment and Propagation and Guidance

Tel. 4240077 Fax 4251005 P.O.Box 92675 Riyadh 11663 E-mail : Sultanah22@hotmail.com

# أصول العقيدة

أعده وترجمه للغة السنهالية

## شعبة توعية الجاليات بالزلفي

الطبعة الأولى ٦/١٤٢٠

ح المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالزلفي ، ١٤٢٠

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات ( الزلفي )

أصول العقيدة – الزلفي

٣٦ ص ١٧/١٢ سم

ردمك : ٩-٦٤-٨١٣-٩٩٦٠

(النص باللغة السنهالية )

١ – العقيدة الإسلامية أ– العنوان

ديوي ٢٤٠ ٢٠/١٦٠٧

رقم الأيداع : ٢٠/١٦٠٧

ردمك : ٩-٦٤-٨١٣-٩٩٦٠

الصف والإخراج: **شعبة توعية الجاليات بالزلفي**

# أصول العقيدة
# මූලික ප්‍රතිපත්තිය

## තවුහීද් (ඒකදේවත්වය)

ඒකදේවත්වය යනුතේ, අල්ලාහ් තආලාට හිමි වන හා ඔහුට වැඳුම් පිදුම් කිරීමට අනිවාර්ය කළ සෑම දේ මගින් ඔහු ඒකත්වය කිරීමයි. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

﴿ وَمَا خَلَقْتُ الْجِنَّ وَالْإِنْسَ إِلاَّ لِيَعْبُدُوْنَ ﴾ الذاريات:٥٦

තවද, ජින් හා මිනිස් වර්ගයන් මාහට ඉබාදත් (සම්පූර්ණයෙන් අවනතවී මාගේ අණ පිළිගෙන ජීවත්වීමට හා මාහට පමණක් වැඳුම් පිදුම්) කිරීමට හැර මා මැවූයේ නැත. (51:56) තවද අල්ලාහ් මෙසේ පවසයි:

﴿ وَاعْبُدُوا اللهَ وَلاَ تُشْرِكُوْا بِهِ شَيْأً ﴾ النساء :٣٦

තවද, අල්ලාහ් තආලාට (පමණක්) වැඳුම් පිදුම් කරන්න. තවද, ඔහුට කිසිවක් සමාන නොකරන්න. (4:36)

තවුහීද් (ඒකදේවත්වය) කොටස් තුනකි. ඒවා තවුහීදුල් රුබූබියියා, තවුහීදුල් උලූහියියා හා තවුහීද් අස්මා වස්සිෆාත් යනාදියන්ය.

### 1. තවුහීදුල් රුබූබියියා

එය මවනු ලැබූ දෙයින්ද, විශ්වය පරිපාලනය කිරීමේ තුලින්ද අල්ලාහ් ඒකත්ව කිරීමයි. ඔහු ආහාර සපයන්නාය.

ජීවත කරන්නාය. විනාශ කරන්නාය. අහසේ හා පොළොවේ පාලනය ඔහු සතුය. අල්ලාහ් තආලා මේ බව මෙසේ පවසයි:

﴿ هَلْ مِنْ خَالِقٍ غَيْرُ اللهِ يَرْزُقُكُمْ مِّنَ السَّمَاءِ وَالْأَرْضِ لَاإِلَهَ إِلاَّ هُوَ﴾ فاطر:٣

අල්ලාහ් හැර අන් මැවුම්කාරයෙකු සිටින්නේද? ඔහු ඔබලාට අහසෙන් හා පොළොවෙන් ආහාර ලබා දෙන්නේය. ඔහු හැර (වැඳුම් පිදුම් කිරීමට සුදුසු) දෙවියෙකු නොමැත. (35:3) තවද, අල්ලාහ් තආලා මෙසේ පවසයි:

﴿ تَبَارَكَ الَّذِىْ بِيَدِهِ الْمُلْكُ وَهُوَ عَلَى كُلِّ شَيْءٍ قَدِيْرٌ ﴾ الملك :١

කවරෙකුගේ අතෙහි රජකම (සර්ව පාලනය) තිබේද? ඔහු ශ්‍රේෂ්ඨ වන්තයාය. ඔහු සියලු දේ කෙරෙහි ශක්ති වන්තයාය. (67:1) විශ්වයේ සැමහි ආධිපත්‍යයා අල්ලාහ් තආලාය. ඔහුගේ නිගමනය පරිදි එය පවතින්නේය.

පාලනය කිරීමෙන් අල්ලාහ් ඒකත්වය කිරීම යනුනේ, ඔහු සියලු මැවීම් පාලනය කිරීමයි. අල්ලාහ් තආලා එය මෙසේ පවසයි:

﴿ أَلاَ لَهُ الْخَلْقُ وَالْأَ مْرُ، تَبَارَكَ اللهُ رَبُّ الْعَالَمِيْنَ ﴾ الأعراف:٥٤

දැනගන්න මැවීමද පාලනය කිරීමද ඔහු සතුය. අල්ලාහ් තආලා ඉමහත් ශ්‍රේෂ්ඨවන්තයාය. ලොව වැසියන්ගේ පෝෂකයාය. (7:54) මෙහි සියලු මැවීම් පාලනය කිරීමද අඩංගුවේ. මිනිසුන්ගෙන් සුළු පිරිසක් මෙම කොටස ප්‍රතික්ෂේප කරති. ඔවුහුද තම හෘදයන් මෙය තහවුරු කරන අතර, ප්‍රසිද්ධියෙන් (පමණක්) ප්‍රතික්ෂප කරති.

අල්ලාහ් මෙසේ පවසයි:

﴿ وَجَحَدُوْا بِهَا وَاسْتَيْقَنَتْهَا أَنْفُسُهُمْ﴾ النمل ١٤

ඔවුන්ගේ හෘදයන් (සත්‍ය බව) ස්ථිර කළද, ඔවුහු ඒවා ප්‍රතික්ෂේප කළහ. (27:14)

## 2. තව්හීදුල් උලූහිය්‍යා

තව්හීදුල් උලූහිය්‍යා යන්නේ, සියලු වැඳුම් පිදුම්වලින් අල්ලාහ් තආලා ඒකත්ව කිරීමයි. මිනිසෙකු අල්ලාහ් සමග වැඳුම් පිදුම් කිරීමට හා ලැගාවීමට අන් කිසිවෙකු තෝරා නොගත යුතුයි. අල්ලාහ් පවසන පරිදි මෙම කොටසෙහි තේරුම, 'අල්ලාහ් තආලා මැවීම් සියල්ල මැව්වේ ඔහු (ට අවනතවීම) සඳහාය' යන්නේය.

﴿وَمَا خَلَقْتُ الْجِنَّ وَالْإِنْسَ إِلاَّ لِيَعْبُدُوْنَ﴾ الذاريات ٥٦

මිනිස් හා පිත් වර්ගයන් මාහට ඉබාදත් (සම්පූර්ණයෙන් අවනතවී මාගේ අණ පිළිගෙන ජීවත්වීමට හා වැඳුම් පිදුම්) කිරීමට හැර, මා මැවුවේ නැත. (51:56) ඔහු දූතයන් එව්වේද, වේද ග්‍රන්ථ පහළ කළේද මෙම තව්හීදය කරාය. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

﴿وَمَا أَرْسَلْنَا مِنْ قَبْلِكَ مِنْ رَّسُوْلٍ إِلاَّ نُوْحِيْ إِلَيْهِ أَنَّهُ لاَ إِلَهَ إِلاَّ أَنَا فَاعْبُدُوْنِ﴾

الأنبياء : ٢٥

(නබිතුමනි) 'නියතවශයෙන්ම, (වැඳුම් පිදුම් කිරීමට අයත්) දෙවියා මා හැර අන් කිසිවෙකු නොමැත, එනිසා මාහටම වැඳුම් පිදුම් කරන්න' නම්වූ නියෝගය (වහී) පහළ නොකර කිසියම් රසූල්වරුන් (දූතයන්) අපි ඔබට

පෙර නොඑව්වෙමු. (21:25) තව්හීදයේ මෙම කොටස, දූත යන් තම සමාජයන් කැඳවූ අවස්ථාවෙහිදී මුෂ්රික්වරුන් (අල්ලාහ්ට හාවුල් කරන්නන්) ප්‍රතික්ෂේප කළ කොටසෙකි. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

﴿ قَالُوٓا۟ أَجِئْتَنَا لِنَعْبُدَ ٱللَّهَ وَحْدَهُۥ وَنَذَرَ مَا كَانَ يَعْبُدُ آبَاؤُنَا ﴾ الأعراف ٧٠

එයට ඔවුන් 'අප මුතුන් මිත්තන් ඇදහීම් කළ දෙවි වරුන් අතහැර, අල්ලාහ් පමණක් ඇදහීම සඳහාද ඔබ අප වෙත පැමිණ (කැඳවා) සිටින්නේ?' යනුවෙන් ඇසීහ. (07:70)

මෙම කාරණාවන් අනුව කිසියම් වැඳුම් පිදුම් වර්ගයන් අල්ලාහ් හැර අන් කිසි අයටද, සමීපවූ මලාඉකාවරුන්ටද, (ආගම්) පහළවූ රසූල්වරුන්ටද, යහපත් වලීවරුන්ටද (දේව ගැත්තන්) හා අන්කිසි මැවීම්වලටද යොමුකිරීම වලංගු නොවන්නේය. කුමක්නිසාදයත්, වැඳුම් පිදුම් සියල්ල කළ යුත්තේ අල්ලාහ්ට පමණි.

## *3. තව්හීදුල් අස්මා වස්සිෆාත්*

මෙය අල්ලාහ් තආලා තමා ගැන නම් (අස්මා) කළ හෝ ලක්ෂණ (සිෆාත්) කළ හෝ නබි මුහම්මදු (සල්) තුමා අල්ලාහ් ගැන නම්කළ හෝ ලක්ෂණ කළ දේ මගින් විශ්වාසය කිරීම හා එම විශ්වාසය කිසියම් වෙනස් කිරීම්, වසංකිරීම්, ප්‍රමාණ කිරීම් හා උදාහරණ කිරීමෙන් තොරව ඔහුගේ මහිමයට ඔබින පරිදි පිළිපැදීමයි. යථාර්ත යෙන් අල්ලාහ් තමා ගැන නම්කළ දේ විශ්වාස කිරීම සියලු දෙනාටම අනිවාර්යවේ.

උදාහරණයක් ලෙස අල්ලාහ් තමා 'හයියුල් කෙයූම් (නිත්‍ය ජීවමානයි) යනුවෙන් නම් කරයි. මෙහිදී 'හයියු'

යනුවෙන් හැඳින්වෙන්නේ ඔහුගේ නාමයෙන් (අස්මාවෙන්) එකක් බවත්, මෙම නාමය විනාශයෙන් තොර සම්පූර්ණ ජීවිතයක් (හයාත්) වර්ණනාවන ඔහුගේ ලක්ෂණයෙන් (සිෆාත්) එකක් බවත්, තවද, අල්ලාහ් තමා සමීඋත් (අසත් නාය) යනුවෙන් නම්කරයි. එය ඔහුගේ නාමයෙන් (අස්මා) එකක් බවත්, එය ඇසීම (සම්උ) වර්ණනාවන ඔහුගේ ලක්ෂණයෙන් එකක් බවත් විශ්වාස කිරීම අනිවාර්යයි. අල්ලාහ් මේ බව මෙසේ පවසයි:

﴿وَقَالَتِ الْيَهُوْدُ يَدُ اللهِ مَغْلُوْلَةٌ، غُلَّتْ أَيْدِيْهِمْ وَلُعِنُوْا بِمَا قَالُوْا، بَلْ يَدَاهُ مَبْسُوْطَتَانِ يُنفِقُ كَيْفَ يَشَاءُ﴾ المائدة : ٦٤

අල්ලාහ්ගේ අත වසා ඇති බව යුදෙව් පවසති. ඔවුන්ගේද අත් වසා තිබේ. මෙසේ කීමෙන් ඔවුහු ශාපයට ලක් වූහ. නමුත්, අල්ලාහ්ගේ දෑත් විවෘතව ඇත. ඔහු සිය හිතුමතය පරිදි වියදම් කරයි. (5:64)

අල්ලාහ් තආලා තමාට විශාල වශයෙන් දානය කිරීමේ දෑත් තිබෙන බව පවසයි. එනිසා ඔහුට දානයෙන් හා ප්‍රධානයෙන් යුත් විවෘත දෑත් තිබෙන බව විශ්වාස කළ යුතුයි. එනමුත් මෙම දෑත් ගැන සිතින් රූපනය කිරීමෙන්ද, මුවින් ප්‍රමාණ කිරීමෙන්ද, මවනලද දෑත්වලට උදාහරණ කිරීමෙන්ද වැළකී සිටිය යුතුයි. කුමක්නිසාදයත්, අල්ලාහ් තආලා මෙසේ පවසයි:

﴿لَيْسَ كَمِثْلِهِ شَيْءٌ وَهُوَ السَّمِيْعُ الْبَصِيْرُ﴾ الشورى:١١

ඔහු හා සමාන කිසි දෙයක් නොමැත. ඔහු ශ්‍රවණය කරන්නාය. නෙත් යොමා සිටින්නාය. (42:11)

තව්හීදයෙහි මෙම කොටසේ සාරාංශය වන්නේ අල්ලාහ්

තආලා හෝ නබිනායකතුමා නියම කළ අල්ලාහ්ගේ අස්මා (නම්) හා සිෆාත් (ලක්ෂණ) යථාර්තයෙන් කිසියම් වෙනස් කිරීම්, උදාහරණ කිරීම්, ප්‍රමාණ කිරීම් හා වසංකිරීමකින් තොරව ක්‍රියා කිරීමයි.

## ලාඉලාහ ඉල්ලල්ලාහ් හි තේරුම

ලාඉලාහ ඉල්ලල්ලාහ්, මෙය ධර්මයේ අත්තිවාරමකි. මෙයට ඉස්ලාම් ධර්මයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිව තිබේ. මෙය ඉස්ලාම්හි අනිවාර්ය කරුණුවලින් ප්‍රථම කරුණෙකි. ඊමානයෙහි කොටස්වලින් උසස්ම කොටසෙකි. ක්‍රියාවන් පිළිගනු ලබන්නේ මෙය මුවින් ප්‍රකාශ කිරීමෙන් හා එහි පරමාර්ථය කරා ක්‍රියා කිරීමෙනි.

ඇත්තවශයෙන්ම මෙහි තේරුමවන්නේ නැමදීමට සුදුස්සා අල්ලාහ් තආලා හැර අන් කිසිවෙකු නොමැති බවය. නමුත් අල්ලාහ් හැර මවන්නෙකු නොමැත හෝ ඔහු හැර ගවේෂණය කරන්නෙකු නොමැත හෝ ඔහු හැර අන් කිසිවක් නොමැත හෝ යන තේරුම (පමණක්) නොවන් නේය. මෙම වැකියට අංග දෙකක් තිබේ.

1. නැති බව ප්‍රකාශ කිරීම
   එය 'ලාඉලාහ' නැමැදීමට සුදුසු කිසියම් දෙයක් නැති බව ප්‍රකාශ කිරීම.
2. ඇති බව ප්‍රකාශ කිරීම
   එය 'ඉල්ලල්ලාහ්' නැමදීමට සුදුස්සා අල්ලාහ් පමණක් ඇති බවත්, ඔහු අසාමාන්‍ය බවත් ඔහුට කොටස් කරුවන් නොමැති බවත් ප්‍රකාශ කිරීම.

එබැවින්, අල්ලාහ්ටම වැඳුම් පිදුම් කළයුතුයි. තවද, ඔහු

හැර අන් කිසිවෙකුට වැඳුම් පිදුම් වලින් කිසිවක් නොකළ යුතුයි. යමෙකු මෙම වැකිය තේරුම්ගෙන එහි පරමාර්ථය කරා ෂිර්කයට පිටුපා, ඒකදේවත්වය පිළිගෙන, ඒවා නිශ්චය කරමින්, ඒ අනුව ක්‍රියා කරන්නේද, ඔහු සත්‍ය මුස්ලිම්වරයාය. තවද, යමෙකු මෙය නිශ්චය කිරීමෙන් තොරව ක්‍රියා කරන්නේද, ඔහු මුනාෆික් (කුහකයා) ය. තවද, යමෙකු මෙම වැකියට එරෙහිව ෂිර්කයන් කෙරෙහි ක්‍රියා කරන්නේද, ඔහු මුවින් ප්‍රකාශ කළත්, මුෂ්රික් කාෆිර්ය.

## *ලාඉලාහ ඉල්ලල්ලාහ් හි විශේෂත්වය*

මෙම පරිශුද්ධ කලිමාවට (දිව්‍ය වැකියට) අප්‍රමාණ විශේෂයන්ද, අධික ප්‍රයෝජනයන්ද තිබේ.

01. අපායට නියමවූ ඒකදේව වාදීන් එහි ස්ථිරව සිටීමෙන් වැළක්වීමට හේතුවේ. බුහාරි සහ මුස්ලිම් ග්‍රන්ථවල සඳහන් පරිදි නබි නායකතුමා මෙසේ පවසයි:

(يُخْرَجُ مِنَ النَّارِ مَنْ قَالَ لاَ إِلَهَ إِلاَّ ا لله وَفِيْ قَلْبِهِ وَزْنُ شَعِيْرَةٍ مِنْ خَيْرٍ ،وَمَنْ قَال لاَ إِلَهَ إِلاَّ ا لله وَفِيْ قَلْبِهِ وَزْنُ بُرَّةٍ مِنْ خَيْرٍ، وَيُخْرَجُ مِنَ النَّارِ مَنْ قَالَ لاَ إِلَهَ إِلاَّ ا لله وَفِيْقَلْبِهِ وَزْنُ ذُرَّةٍ مِنْ خَيْرٍ.) رواه البخاري ومسلم

ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් පවසන යමෙකුගේ සිතෙහි තිරිඟු පිටි ප්‍රමාණයක කුසල් තිබේ. ඔහුද, ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් පවසන තවත් යමෙකු ගේ සිතෙහි තිරිඟු ඇට ප්‍රමාණයක කුසල් තිබේ. ඔහුද, ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් පවසන තවත් යමෙකු ගේ සිතෙහි පරමාණුව ප්‍රමාණයක කුසල් තිබේ

මහුද අපායෙන් නිදහස් වෙති.

02. මිනිස් හා ජින් වර්ගයන් මවන ලද්දේ මෙම (කලිමා) දිව්‍ය වැකිය නිසාය. අල්ලාහ් පවසයි:

﴿ وَمَا خَلَقْتُ الْجِنَّ وَالْإِنسَ إِلاَّ لِيَعْبُدُوْنَ ﴾ الذاريات:٥٦

තවද, මිනිස් හා ජින් වර්ගයන් මාහට ඉබාදත් (සම්පූර්ණයෙන් අවනතවී මාගේ අණ පිළිගෙන මාහට පමණක් වැඳුම් පිදුම්) කිරීමට හැර මා මැවූයේ නැත. (51:56)

03. දූතයන් එවන ලද්දේද, වේද ග්‍රන්ථ පහළවූයේද මේ සඳහාය. අල්ලාහ් පවසයි:

﴿ وَمَا أَرْسَلْنَاكَ مِنْ قَبْلِكَ مِنْ رَّسُوْلٍ إِلاَّ نُوْحِيْ إِلَيْهِ أَنَّهُ لاَ إِلَهَ إِلاَّ أَنَا فَاعْبُدُوْنَ ﴾ الأنبياء:٢٥

නබිතුමනි, ඔබට පෙර එවූ සෑම දූතයෙකුටම 'නිශ්චය වශයෙන්ම වැඳුම් පිදුම් කිරීමට අයත් දෙවියා මා හැර අන් කිසිවෙකු නොමැත. එනිසා මාහට වැඳුම් පිදුම් කරන්න'. යනුවෙන් අපි වහී මගින් පවසා ඇත්තෙමු. (21:25)

04. මෙය දූතයන්ගේ කැඳවීමේ යතුරය. සෑම දූතයන්ම මෙය කරා කැඳවූහ. ඔවුන් තම සමාජයන් කැඳවූයේ මෙසේය.

﴿... اُعْبُدُوا اللهَ مَا لَكُمْ مِنْ إِلَهٍ غَيْرُهُ ﴾ الأعراف:٧٣

අල්ලාහ්ට වැඳුම් පිදුම් කරන්න. මහු හැර ඔබලාට කිසියම් දෙවියෙකු නොමැත. (7:73)

05. මෙය අල්ලාහ් සිහිකිරීමේ දික්ර් (භාවනා) වලින් ශ්‍රේෂ්ඨයෙකි. නබිනායක තුමා මෙසේ පවසයි:

(أَفْضَلُ مَا قُلْتُ أَنَا وَالنَّبِيُّوْنَ مِنْ قَبْلِيْ لاَ إِلَهَ إِلاَّ اللهُ وَحْدَهُ لاَ شَرِيْكَ لَهُ)

رواه مالك في الموطأ

මමද මට පෙර ආ නබිවරුද පැවැසූ වැදගත් දිව්‍ය වැකිය 'ලාඉලාහ ඉල්ලල්ලාහු වහ්දහූ ලා ෂරීකලහූ' යන්නේය. (මුවත්තා ග්‍රන්ථය ඇසුරෙනි)

## ලාඉලාහ ඉල්ලල්ලාහ් හි කොන්දේසි

ලාඉලාහ ඉල්ලල්ලාහ් කොන්දෙසි හතකින් සමන්විතයි. දාසයෙකු මෙයින් කිසිවක් කිසියම් වෙනස් කිරීමකින් තොරව එකසේ පිළිපදින්නේද එවිට මෙම කලිමාව වලංගු වේ. ඒවා මෙසේය.

1. දැනුම

   වැළකීම (ප්‍රතික්ෂේප කිරීම) හා නිරතවීම (ස්ථිර වීම) යන තේරුමද, ඒ අනුව ක්‍රියා කිරීමේ අවශ්‍යතාවයද වටහා ගැනීම.

   අල්ලාහ් වැඳුම් පිදුම්වලට සුදුස්සාය, ඒකීයයාය, ඔහුට හැර අන් කිසි කෙනෙකුට කරන වැඳුම් පිදුම් වලංගු නොවන බව දාසයෙකු වටහා ගෙන ඒ අනුව ක්‍රියා කරන්නේද, යථාර්තයෙන් ඔහු තමා බුද්ධිමතාය. අල්ලාහ් මෙසේ පවසයි:

﴿ فَاعْلَمْ أَنَّهُ لاَ إِلَهَ إِلاَّ اللهُ ﴾ محمد : ١٩

එනිසා දැනගන්න, නිශ්චය වශයෙන්ම අල්ලාහ් තආලා හැර (වෙනත්) කිසියම් දෙවියෙකු නොමැත. (47:19) නබි නායකතුමා මෙලෙස පවසයි:

( مَنْ مَاتَ وَهُوَ يَعْلَمُ أَنَّهُ لاَ إِلَهَ إِلاَّ اللهُ دَخَلَ الْجَنَّةَ ) رواه مسلم

කවරෙකු, වැඳුම් පිදුම්වලට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බව තේරුම් ගෙන සිටියදී මරණයට පත්වෙන්නේද, ඔහු ස්වර්ගයට පිවිසේ. (මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

## 2. නිශ්චය කිරීම

මෙය මිනිස් හා ජින් වර්ගයේ ෂෛතාන්වරු (යක්ෂයන්) පතුරුවන සැකයෙන් තොරව, තම සිත සන්සුන් වනසේ නිශ්චයකර ෂහාදා (සාක්ෂිය) ප්‍රකාශ කිරීමයි. නමුත්, එය ස්ථිරයෙන් හා නිශ්චයෙන් කිව යුතුයි. අල්ලාහ් මෙසේ පවසයි:

﴿ إِنَّمَا الْمُؤْمِنُوْنَ الَّذِيْنَ آمَنُوْا بِاللهِ وَرَسُوْلِهِ ثُمَّ لَمْ يَرْتَابُوْا ﴾

الحجرات: ١٥

නියත වශයෙන්ම (සත්‍ය) විශ්වාස වන්තයන් කවරෙහුද යත්, ඔවුන් අල්ලාහ් හා ඔහුගේ දූතයා කෙරෙහි විශ්වාසය කිරීමෙන් පසු (මේ ගැන කිසියම්) සැකයක් නොකර සිටින්නන්ය. (49:15) නබිතුමා මෙසේ පවසයි:

( أَشْهَدُ أَنْ لاَ إِلَهَ إِلاَّ اللهُ وَأَنِّيْ رَسُوْلُ اللهِ لاَ يَلْقَى اللهَ بِهِمَا عَبْدٌ غَيْرُ شَاكٍّ إِلاَّ دَخَلَ الْجَنَّةَ ) رواه مسلم

අල්ලාහ් හැර අන් දෙවියෙකු නොමැති බවත්, මා අල්ලාහ්ගේ දූතයා බවත් සාක්ෂි දරා කියමි. සැකයෙන් තොරව මෙම කරුණු දෙක මත අල්ලාහ්ව බැහ දකින

දාසයා ස්වර්ගයට පිවිසේ.

## 3. පිළිගැනීම

මෙය මෙම කලිමාවේ අඩංගු සියලු දේ සිතින් හා මුවින් පිළිගැනීමයි. තවද, නබිනායක තුමාගේ කියමන් හා එතුමාගෙන් ලැබූ සියලු දේ කිසියම් ප්‍රතික්ෂේප යෙන් තොරව පිළිගැනීමයි. අල්ලාහ් පවසයි:

﴿ آمَنَ الرَّسُوْلُ بِمَا أُنْزِلَ إِلَيْهِ مِنْ رَبِّهِ وَالْمُؤْمِنُوْنَ، كُلٌّ آمَنَ بِاللهِ وَمَلَائِكَتِهِ وَكُتُبِهِ وَرُسُلِهِ لَانُفَرِّقُ بَيْنَ أَحَدٍ مِّنْ رُّسُلِهِ، وَقَالُوْا سَمِعْنَا وَأَطَعْنَا غُفْرَانَكَ رَبَّنَا وَإِلَيْكَ الْمَصِيْرُ ﴾ البقرة ٢٨٥

තමාගේ ස්වාමියා (අල්ලාහ්) විසින් පහළ කළ සියලු දේ රසූල්වරුන් (දූතයන්) විශ්වාස කළහ. එසේම විශ් වාස වන්තයන්ද විශ්වාස කළහ. (මෙම) සියලු දෙනාම මලාඉකාවරුන්, දේව ග්‍රන්ථයන් හා රසූල් වරුන් විශ් වාස කළහ. අපි රසූල්වරුන් අතර වෙනස්කම් ඇති නොකරන්නෙමු. තවද, අපි ඇහුවෙමු. පිළිපැද්දෙමු. දෙවියනේ, ඔබෙන් අපි සමාව අයැදින්නෙමු. ඔබ වෙත ද අපි යළි පැමිණෙන්නෙමු. යනුවෙන් ඔවුහු පැවැසීහ. (2:285)

ෂරීආ නීති රීතිවලින් කොටසක් හෝ එහි දණ්ඩ නීතිය හෝ මේ සියල්ල හෝ ප්‍රතික්ෂේප කරන්නන් මෙම (කලිමාව) පිළිනොගන්නන් හා ප්‍රතික්ෂේප කරන්නන්ය. මෙවෙන්නන්ට සොරකමට දෙන දඩුවම හෝ අනාචාරයට දෙන දඩුවම හෝ බහුභාර්ය සේවනය හෝ හිමිකම් නීතිරීතියන් හෝ මෙවැනි දේ ප්‍රතික්ෂේප

කරන්නන් උදාහරණයෙකි. අල්ලාහ් මෙසේ පවසයි:

﴿ وَمَا كَانَ لِمُؤْمِنٍ ولاَ مُؤْمِنَةٍ إِذَا قَضَى ا للهُ وَرَسُوْلُهُ أَمْرًا أَنْ يَّكُوْنَ لَهُمُ الْخِيَرَةُ مِنْ أَمْرِهِمْ﴾ الأحزاب:٣٦

අල්ලාහ් තආලා හා නබිතුමා යම් කිසි දෙයක් තීරණය කළායින් පසු ඒ ගැන විකල්ප තීරණ ගැනීමේ අයිතිය කිසියම් විශ්වාසවන්ත පුරුෂයෙකුට හෝ ස්ත්‍රියෙකුට නොමැත. (33:36)

## 4. වහල්වීම

එය පරිශුද්ධ කලිමාව දැනුම්දෙන පරිදි වහල් (යටත්) වීමයි. වහල්වීම හා පිළිගැනීම අතර වෙනසක් තිබේ. පිළිගැනීම යන්නේ (කලිමාවේ) තේරුම මුවින් ප්‍රකාශ කිරීමයි. වහල්වීම යන්නේ ක්‍රියාවෙන් පිළිපැදීමයි. යමෙකු ලාඉලාහ ඉල්ලල්ලාහ් හි තේරුම දැන ගෙනද, එය නිශ්චයකරද, පිළිගැනද සිටී. නමුත් ඒ අනුව එහි ඉලක්කය කරා ඔහු ක්‍රියා නොකරන්නේද එය නිශ්ඵලවේ. අල්ලාහ් මෙලෙස පවසයි:

﴿ وَأَنِيْبُوْا إِلَى رَبِّكُمْ وَأَسْلِمُوْا لَهُ ﴾ الزمر :٥٤

තවද, (මනුෂ්‍යයෙනි, වේදනාවට ලක්වීමට පෙර) ඔබගේ දෙවියා වෙතට (පව් සමාව අයැද) යොමුවන්න. සම්පූර්ණයෙන්ම ඔහුට වහල්වන්න. (39:54) තවද ඔහු මෙය මෙසේ පවසයි:

﴿فَلاَ وَرَبِّكَ لاَ يُؤْمِنُوْنَ حَتَّى يُحَكِّمُوْكَ فِيْمَا شَ جَرَ بَيْنَهُمْ ثُمَّ لاَ يَجِدُوْا

فِيْ أَنْفُسِهِمْ حَرَجًا مِّمَّا قَضَيْتَ وَيُسَلِّمُوْا تَسْلِيْمًا ﴾ النساء :٦٥

ඔබ දෙවියා මත දිවුරා කියමි. ඔවුන් තමන්තුල ඇතිවූ ප්‍රශ්නවලදී ඔබව විනිශ්චයකරු ලෙස පිළිගැනීමෙන් පසු ඔබ කළ විනිශ්චය ගැන තෘප්තිමත්වී එම විනිශ්චය පිළිගන්නාතුරු ඔවුහු විශ්වාස වන්තයන් විය නොහැක. (4:65)

## 5. සත්‍යභාවය

සත්‍යභාවය අල්ලාහ් සමගයි. එය විශ්වාසය කෙරෙහිද, ප්‍රතිපත්තිය කෙරෙහිද සත්‍යවන්තයා විය යුතුයි. අල්ලාහ් මෙසේ පවසයි.

﴿ يَا أَيُّهَاالَّذِيْنَ آمَنُوا اتَّقُوا ا للهَ وَكُوْنُوْا مَعَ الصَّادِقِيْنَ ﴾ التوبة:١١٩

විශ්වාසවන්තයෙනි, අල්ලාහ් තආලාට බියවී (ප්‍රකාශයෙන් හා ක්‍රියාවෙන්) සත්‍යවන්තයන් සමග සිටින්න. (9:119) නබි නායක තුමා පවසයි

( مَنْ قَالَ لاَ إِلَهَ إِلاَّ ا للهُ صَادِقًا مِنْ قَلْبِهِ دَخَلَ الْجَنَّةَ ) رواه أحمد في المسند

කවරෙකු තම සිතින් සත්‍යයෙන්ම 'නැමදීමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැත' යනුවෙන් පවසන්නේද ඔහු ස්වර්ගයට පිවිසෙයි. (මුස්නද් අහ්මද්)

යමෙකු ෂහාදත් (සාක්ෂිය) මුවින් පවසා එහි යථාර්තය සිතින් ප්‍රතික්ෂේප කරන්නේද ඔහුට ජය නොලැබේ. ඔහු මුනාෆික් වරුන්ගෙන් අයෙක්වේ. නබිනායකතුමා ගෙන ආ දේයින් සමහරක් හෝ සියල්ල හෝ බොරු කිරීම සත්‍යභාවය නැති කිරීමකි. මන්දයත්, අල්ලාහ්

නබි නායකතුමාව පිළිපදින ලෙසත්, ඔහු සත්‍ය කරන ලෙසත් අපට අණකර ඇත. තවද, අල්ලාහ් එය තමා පිළිපැදීම සමගම මෙසේ සඳහන් කරයි.

﴿ قُلْ أَطِيعُوا اللهَ وَأَطِيعُوا الرَّسُولَ... ﴾ النور : ٥٤

(නබිතුමනි) පවසන්න. 'අල්ලාහ් තආලාව පිළිපදින්න. තවද, (ඔහුගේ) දූතයාද පිළිපදින්න. (24:54)

## 6. චිත්ත පාරිශුද්ධිය

එය මිනිසා සියලු ෂිර්කයෙන් තොරව පවිත්‍ර සිතු විල්ලෙන් තම ක්‍රියාවන් නිස්කලංක කිරීමයි. ඔහුගේ ප්‍රකාශ හා ක්‍රියා සියල්ල අල්ලාහ් වෙනුවෙන් යන චිත්ත පාරිශුද්ධියෙන් හා ඔහුගේ තෘප්තිය අපේක්ෂා වෙන් තිබීමයි. මෙහි මුණිවචාව හෝ ප්‍රසිද්ධිය හෝ ලාභ සිතුවිල්ල හෝ කෙනෙකුගේ වාසිය හෝ බාහිර, අභ්‍යන්තර ආසාවන් හෝ යමෙකුගේ ආදරයට ක්‍රියා කිරීම හෝ මද්හබයට ඇබ්බැහිවීම හෝ අල්ලාහ්ගේ යහ මග හැර අන් මගත් පිළිපැදීම හෝ නොවිය යුතුයි. නමුත්, අල්ලාහ් වෙනුවෙන් කැඳවීමේ හා පර ලොවෙහි තෘප්තිය තිබීම අවශ්‍යයයි. කිසියම් කෙනෙ කුගේ ප්‍රතිලාභය හෝ තුතිය සිතින් අපේක්ෂා නොකළ යුතුයි. අල්ලාහ් පවසයි:

﴿ أَلَا لِلَّهِ الدِّينُ الْخَالِصُ ﴾ الزمر : ٣

දැනගන්න, පිරිසිදු වත් පිළිවෙත් (සියලු ඇදහීමයන්) අල්ලාහ්ටය. (39:3) අල්ලාහ් තආලා මෙය මෙසේ පව සන්නේය:

﴿وَمَا أُمِرُوْا إِلاَّ لِيَعْبُدُوا ا للهَ مُخْلِصِيْنَ لَهُ الدِّ يْنَ﴾ البينة :٥

අල්ලාහ් තආලා කෙරෙහි තමන්ගේ වැඳුම් පිදුම් (යහපත් මාර්ගයෙන්) චිත්ත පාරිශුද්ධියෙන් කිරීම සඳහා ඔවුන්ට අණකරන ලදී. (98:5) තවද, බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථයෙහි සඳහන් නබිතුමා පැවැසූ වැකියක් උත්බාන් (රලි) මෙසේ පවසයි.

( فَإِنَّ ا للهَ قَدْ حَرَّمَ عَلَى النَّارِ مَنْ قَالَ لاَ إِلَهَ إِلاَّ ا للهُ يَبْتَغِيْ بِذَلِكَ وَجْهَ ا للهِ) رواه البخاري ومسلم

නිශ්චයවශයෙන්ම යමෙකු අල්ලාහ් තආලාගේ තෘප්තිය තකා 'ලඉලාහ ඉල්ලල්ලාහ්' යනුවෙන් පවසන්නේද, ඔහුට අල්ලාහ් අපාය තහනම් කරයි. (බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)

## 7. අල් මහබ්බා-ආදරය කිරීම

අල්මහබ්බා යන්නේ, මෙම වැදගත් වැකිය (කලිමාව) ද, එය දැනුම්දෙන කරුණද, එහි අරමුණද ආදරය කිරීමයි. එනිසා අල්ලාහ්ට හා ඔහුගේ රසූල්වරයාට ආදරය කළ යුතුයි. එම ආදරය අන් සියලු ආදරයට වඩා උසස්විය යුතුයි. තවද, ආදරය කිරීම පිළිබඳ කොන් දේසිය හා එයට අවශ්‍ය දේ අනුගමනය කළ යුතුයි.

එබැවින්, අල්ලාහ් තආලට, ඔහුගේ ගෞරවය, කීර්තිය, බිය, අපේක්ෂාව යනාදියෙන් යුත් ඇල්මෙන් ආදරය කළ යුතුයි. එසේම පොදුවෙන් මක්කා, මදීනා හා දේවස්ථානය (මස්ජිද්) යන අල්ලාහ් ප්‍රියකරන ස්ථානද, රමසාන් මාසය, හජ් මාසයේ (ප්‍රථම) දින දහය හා

වෙනත් අල්ලාහ් ප්‍රියකරන කාල පරිච්ඡේදයන්ද, නබිවරුන්, රසූල්වරුන්, මලාඉකාවරුන්, සත්‍යවන්තයන්, පරිත්‍යාගශීලීන්, යහපත්ශීලීන් හා වෙනත් අල්ලාහ් ප්‍රිය කරන අයද, නැමදීම, සකාතය ගෙවීම, උපවාසයේ යෙදීම හජ් කර්තව්‍යය ඉටු කිරීම යන අල්ලාහ් ප්‍රිය කරන ක්‍රියාවන්ද, දික්ර් (සිහිකිරීම) හා කුරානය පාරායනය කිරීම යන අල්ලාහ් ප්‍රියකරන මුවින් ප්‍රකාශ කරන දේද ආදරය කළ යුතුයි.

තවද, තමා පිළිබඳ ආදරයටද, තමාගේ ආසාවටද හා ප්‍රියටද වඩා අල්ලාහ් පිළිබඳ ආදරයට වැදගත් තැන දීම ආදරය කිරීමෙකි. තවද, ඔහු අප්‍රිය කරන දේ අප්‍රිය කිරීමද ආදරයෙකි. ඔහු කාෆිර්වරුන් (ප්‍රතික්ෂේප කරන්නන්) අප්‍රිය කරයි. එනම්, කුෆ්ර්, අකුසල් හා පාප ක්‍රියාවන් අප්‍රිය කළ යුතුයි. අල්ලාහ් මෙසේ පවසයි:

﴿ يَا أَيُّهَاالَّذِيْنَ آمَنُوْا مَنْ يَّرْتَدَّ مِنْكُمْ عَنْ دِيْنِهِ فَسَوْفَ يَأْتِي ا للهُ بِقَوْمٍ يُحِبُّهُمْ وَيُحِبُّوْنَهُ أَذِلَّةٍعَلَى الْمُؤْمِنِيْنَ أَعِزَّةٍ عَلَى الْكَافِرِيْنَ يُجَاهِدُوْنَ فِيْ سَبِيْلِ ا للهِ وَلاَ يَخَافُوْنَ لَوْمَةَ لاَئِمٍ ﴾ المائدة : ٥٤

විශ්වාස වන්තයෙනි, ඔබෙන් කවරෙකු හෝ ඔහුගේ ආගම අතහැර යන්නේද, (අල්ලාහ් තආලාට කිසියම් පාඩුවක් නොවන්නේය.) එවිට අල්ලාහ් වෙනත් සමාජ යක් ගෙන එයි. ඔහු ඔවුන්ව ආදරය කරයි. ඔවුහුද ඔහු ආදරය කරති. ඔවුන් මු:මින්වරුන් (විශ්වාස වන්තයන්) සමග කීකරුවෙන්ද, කාෆිර්වරුන් (ප්‍රතික් ෂේප කරන්නන්) සමග අකීකරු වෙන්ද හැසිරෙති. අල්ලාහ්ගේ මගහි සටන් කරති. නින්දා කරන්නන්ගේ

නින්දාවලට නොබිය වෙති. (5:54)

## මුහම්මදුර් රසූලුල්ලාහ් හි තේරුම

මෙහි තේරුම වනුයේ, නබිනායකතුමා මුලු මිනිස් සමාජය කරා එවනලද අල්ලාගේ දූතයා (රසූල්) හා දාසයා (අබ්ද්) ලෙස බාහිරවද, අභ්‍යන්තරවද දැනගැනීම සහ ඔහු අණ කළ දේ පිළිපැදීමෙන්, ඔහු දැනුවත් කළ දේ සත්‍ය කිරීමෙන් හා ඔහු වලක්වූ දේ වැලකීමෙන් එහි අරමුණ කරා ක්‍රියා කිරීමයි. තවද, අල්ලාහ් නියම කළ පරිදි වැඳුම් පිදුම් කිරීමයි.

නබි නායකතුමා අල්ලාහ්ගේ දූතයා වශයෙන් සාක්ෂි දීමට කරුණු දෙකක් තිබේ. එය අබ්දු (දාසයා) හා රසූල් (දූතයා) වන්නේය. මෙම කරුණු දෙක නබි නායකතුමා කෙරෙහි සීමාව ඉක්මවා යාමද, අවතක්සේරු කිරීමද නැතිකරයි. ඔහු අල්ලාහ්ගේ දාසයා හා දූතයාය. ඔහු මෙම උතුම් ලක්ෂණ දෙකෙකින්ම සියලු මැවුම් අතර සම් පූර්ණ වන්නයාය. මෙහි අබ්ද් හි තේරුම අදහන දාසයාය. එනම් ඔහු මවනලද අනෙකුත් මිනිසුන් සේ මිනිසාය. ඔවුන්ට සිදු වන දේ ඔහුටද සිදුවන්නේය. අල්ලාහ් මෙසේ පවසයි.

﴿ قُلْ إِنَّمَا أَنَا بَشَرٌ مِّثْلُكُمْ ﴾ الكهف: ١١٠

(නබිතුමනි,) ඔබ පවසන්න, නිශ්චය වශයෙන්ම මමද ඔබලා සේ මිනිසෙකි. (18:110) තවද, අල්ලාහ් පවසයි:

﴿الْحَمْدُ لِلَّهِ الَّذِىْ أَنْزَلَ عَلَى عَبْدِهِ الْكِتَابَ وَلَمْ يَجْعَلْ لَهُ عِوَجًا﴾ الكهف: ١

සියලුම ප්‍රශංසා තමාගේ දාසයා වෙත කිසියම් ඇදයක් (අඩුවක්) නොමැති කුරානය පහළ කළ අල්ලාහ් තආලා ටම හිමිවේ. (18:1)

රසූල් යන්නේ මුළු මිනිස් සමාජයන් වෙත අල්ලාහ් දෙවියන් කරා කැඳවීම සඳහා එවනලද සුභාරංචි පතන්නා හා අවවාද කරන්නාය.

මෙම කරුණු දෙක මත සාක්ෂි පැතීම නබිනායක තුමා කෙරෙහි පහසුවෙන් සිතීමද, සීමා ඉක්මවා යාමද වළක් වයි. නබිතුමා ඔහුගේම සමාජයේ (සාමාන්‍ය) කෙනෙක් ලෙස තර්ක කරන්නන් එතුමා අවතක්සේරු කරන්නන්ය. එතුමා පිළිබඳව සීමා ඉක්මවා කරන්නන් ඔහු දාසයා යන ස්ථානයෙන් බැහැරකර වැඳුම් පිදුම්වලට සුදුස්සා කිරීම ටත්, අල්ලාහ් හැර එතුමාගෙන් පව් සමාව අයැදීමටත්, (අල්ලාහ් හැර ඔහු සුදුස්සා නොවී සිටියදී) තමන්ගේ අවශ්‍යථා ඉටුකිරීම හා කරදරයෙන් මුදාවීම සඳහා ඉල්ලීමටත් පටන් ගත්හ. තවත් පිරිසක් එතුමාගේ සංදේශය ප්‍රතික්ෂේප කළ අතර එතුමා පිළිපැදීමෙන් අඩු පාඩු කළහ. තවද, එතුමා ගෙන ආ දේට එරෙහි විරුද්ධ ප්‍රකාශවල නිරතව සිටිහ.

## විශ්වාසයේ අනිවාර්ය කරුණු

නියතවශයෙන්ම ප්‍රකාශයේ හා ක්‍රියාවේ වලංගුභාවය හා පිළිගැනීම පවතින්නේ නිවැරදි ප්‍රතිපත්තිය මත බව අල් කුරානයේ හා අල් හදීසයේ ආධාර මාර්ගයෙන් දැන ගන්නට ලැබේ. එනිසා ප්‍රතිපත්තිය නිවැරදි නොවන්නේද, එවිට එම ප්‍රතිපත්තියෙන් සිදුවන සියලු ප්‍රකාශයන් හා ක්‍රියාවන් අවලංගුවේ. අල්ලාහ් මෙසේ පවසයි:

﴿ وَمَنْ يَكْفُرْ بِالْإِيْمَانِ فَقَدْ حَبِطَ عَمَلُهُ وَهُوَ فِي الْآخِرَةِ مِنَ الْخَاسِرِيْنَ ﴾

المائدة:٥

තවද, කවරෙකු විශ්වාසකිරීම ප්‍රතික්ෂේප කරන්නේද, ඔහුගේ ක්‍රියාව විනාශවේ. තවද, ඔහු පරලොවෙහි අලාභ යට පත්වූ අය සමග සිටී. (5:5) තවද අල්ලාහ් මෙලෙස පවසයි:

﴿وَلَقَدْ أُوْحِيَ إِلَيْكَ وَإِلَى الَّذِيْنَ مِنْ قَبْلِكَ، لَئِنْ أَشْرَكْتَ لَيَحْبَطَنَّ عَمَلُكَ وَلَتَكُوْنَنَّ مِنَ الْخَاسِرِيْنَ ﴾ الزمر:٦٥

තවද, (නබිතුමනි) ඔබ (දෙවියාට) ෂිර්ක් කිරීමෙහි යෙදෙන්නේද, ඔබගේ ක්‍රියා සියල්ල විනාශවේ. ඔබ අලාභ කරුවන්ගෙන් කෙනෙකු ලෙස පත්වේ. යනුවෙන් ඔබටත් ඔබට පෙර සිටි අයටත් වහී (වේද වැකිය) මගින් පවසන ලදී. (39:65)

නියත වශයෙන්ම නිවැරදි ප්‍රතිපත්තිය (අකීදා) වන්නේ, අල්ලාහ්ද, ඔහුගේ මලාඉකාවරුන්ද, ඔහුගේ දේව ග්‍රන්ථද, ඔහුගේ දූතයන්ද, අවසාන දිනයද, ඉරණමද චිත්ත පාරිශුද්ධියෙන් විශ්වාස කිරීම බව අල් කුරානය හා අල් හදීසය අනාවරණය කරයි.

එබැවින් මෙම කරුණු හය නිවැරදි (පැහැදිළි) මූලික ප්‍රතිපත්තියෙකි. කුමක්නිසාදයත්, අල්ලාහ් වේද ග්‍රන්ථ පහළ කළේද නබි මුහම්මදු (සල්) තුමා එවවේද මෙම නිවැරදි ප්‍රතිපත්තිය කරාය. මෙය ඊමාන් (විස්වාස කිරීමේ) අනිවාර්ය කරුණු ලෙස හැඳින්වේ.

## 1.අල්ලාහ් කෙරෙහි විශ්වාස කිරීම

මෙය නැමදීමට සුදුස්සා හා හිමිකාරයා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බව විශ්වාස කිරීමයි. කුමක් නිසාදයත්, ඔහු ඔහුගේ දාසයන් මවන්නාය. ඔවුන්ට උපකාර කරන්නාය. ආහාර සපයන්නාය. ඔවුන්ගේ රහස හා පරහස දැන සිටින්නාය. ඔවුන්ගෙන් අවනතවන්නන්ට (ඇදහීම් කරන්නන්ට) ත්‍යාගද, පාපකරුවන්ට දඬුවමද දීමට ශක්ති වන්තයාය. අල්ලාහ් මිනිස් හා ජින් වර්ගයන් මවා මෙම ඇදහීම ඉටු කිරීම සඳහා ඔවුන්ට අණ කළාය. අල්ලාහ් මෙසේ පවසයි:

﴿ وَمَا خَلَقْتُ الْجِنَّ وَالْإِنْسَ إِلاَّ لِيَعْبُدُوْنِ ، مَا أُرِيْدُ مِنْهُمْ مِّنْ رِّزْقٍ وَّمَا أُرِيْدُ أَنْ يُّطْعِمُوْنِ، إِنَّ اللهَ هُوَ الرَّزَّاقُ ذُوالْقُوَّةِ الْمَتِيْنُ ﴾ الذاريات:٥٦-٥٨

තවද, ජින් හා මිනිස් වර්ගයන් මාහට ඉබාදත් (සම්පූර්ණයෙන් අවනතවී මාගේ අණ පිළිගෙන ජීවත්වීමට හා මාහට පමණක් වැඳුම් පිදුම්) කිරීමට හැර මා මැවූයේ නැත. මා කිසියම් සම්පතක් ඔවුන්ගෙන් අපේක්ෂා නොකරමි. මාහට ඔවුන් ආහාර සැපයීමද අපේක්ෂා නොකරමි. නියත වශයෙන්ම අල්ලාහ් තආලා ආහාර සපයන්නාය. බලවත් ශක්තිවන්තයාය. (51:56-58)

අල්ලාහ් දූතයන් එව්වේද, වේද ග්‍රන්ථ පහළ කළේද මෙම සත්‍යතාවය පැහැදිලි කිරීමටත් එය කරා කැඳවීමටත් එයට විරුද්ධ දේයින් වැළකී සිටීමටත්ය. අල්ලාහ් පවසයි:

﴿ وَلَقَدْ بَعَثْنَا فِيْ كُلِّ أُمَّةٍ رَّسُوْلًا أَنِ اعْبُدُوا اللهَ وَاجْتَنِبُوا الطَّاغُوْتَ ﴾

النحل:٣٦

නිශ්චයවශයෙන්ම ඔබ අල්ලාහ්ටම වැඳුම් පිදුම් කරන්න. යක්ෂයන් (ෂෛතාන් වරුන්) ගෙන් වැළකින්න. යනුවෙන් පැවසීම සඳහා අපි සෑම සමාජයටම රසූල්වරුන් (දූතයන්) එව්වෙමු. (16:36)

මෙම ඉබාදත් හි යථාර්තය වන්නේ ප්‍රාර්ථනා කිරීම, බියවීම, අපේක්ෂා කිරීම, නැමදීම, උපවාස කිරීම, කැපීම, භාර කිරීම හා වෙනත් ඇඳහීම් සියල්ල අල්ලාහ් වෙනු වෙන් යන චිත්ත පාරිශුද්ධියෙන් ඔහු ඒකත්වය කිරීමයි. මෙය සම්පූර්ණ ආදරයෙන් යුත් ඇල්මෙන්ද, බියෙන්ද තිබිය යුතුයි. අල් කුරානයෙහි අධික ලෙස සඳහන් වන්නේ මෙම වැදගත් මූලික කරුණු පිළිබඳවය. අල්ලාහ් මෙසේ පවසයි:

﴿ فَاعْبُدِ ا للهَ مُخْلِصًا لَّهُ الدِّيْنَ ، أَلاَ لِلَّهِ الدِّيْنُ الْخَالِصُ ﴾ الزمر: ٢، ٣

ඔබ ආගම කෙරෙහි පාරිශුද්ධියෙන් අල්ලාහ් නමදින්න. දැනගන්න, පාරිශුද්ධ ආගම (ට අයත් නැමඳුම් සියල්ල) අල්ලාහ්ටම හිමිවේ. (39:2,3) තවද, අල්ලාහ් පවසයි:

﴿ وَقَضَى رَبُّكَ أَلاَّ تَعْبُدُوْا إِلاَّ إِيَّاهُ ﴾ الإسراء: ٢٣

ඔහුටම හැර (අන් කිසිවෙකුට) ඔබ නොඅදහන ලෙස ඔබේ දෙවියා නියම කරයි. (17:23) තවද අල්ලාහ් පවසයි:

﴿ فَادْعُوا ا للهَ مُخْلِصِيْنَ لَهُ الدِّيْنَ وَلَوْ كَرِهَ الْكَافِرُوْنَ ﴾ غافر: ١٤

එනිසා, කාෆිර්වරු ප්‍රතික්ෂේප කළත්, ඔබලා සම්පූර්ණයෙන්ම අවනතවී ආගම කෙරෙහි පාරිශුද්ධියෙන් ඔහු වෙත පමණක් ප්‍රාර්ථනා අයැදින්න. (40:14)

අල්ලාහ් තආලා තම දාසයන්ට අනිවාර්ය කළ සියලු දේ හා ඉස්ලාමයෙහි බාහිර කරුණු මගින් ඔවුන්ට නියම කළ දේ විශ්වාස කිරීමද අල්ලාහ් විශ්වාස කිරීමෙකි. ඒවා, වැඳුම් පිදුම් කිරීමට අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බවත්, මුහම්මත්තුමා අල්ලාහ්ගේ දූතයා බවත් සාක්ෂි දීම, සලාත් නැමදුම ඉටුකිරීම, සකාතය ගෙවීම, රාමසාන් උපවාස ශීලයේ යෙදීම හා ශක්තිවන්තයන් හජ් කර්තව්‍යය ඉටුකිරීම යනාදීන්ද, ෂරීආ (ආගම) අනිවාර්ය කළ වෙනත් කාර්යයන්දවේ. මෙයින් උතුම් හා වැදගත් කරුණ වන්නේ ලාඉලාහ ඉල්ලල්ලාහු මුහම්මදුර් රසූලුල්ලාහි යන්නේය.

මෙම විශ්වය මැව්වේද, තම ඥානය හා ශක්තිය මත ලොව වැසියන් පාලනය කරන්නේද අල්ලාහ්ය. ඔහු මෙලොව හා පරලොව පාලනය කරන්නාය. සියලු ලොව වැසියන්ගේ පාලකයාය. ඔහු හැර අන් කිසි මවන්නෙකුද පාලකයෙකුද නොමැත.

ඔහු රසූල්වරුන් එව්වේද, වේද ග්‍රන්ථ පහළ කළේද දාසයන් ශීලාචාර කිරීමටද ඔවුන්ගේ ජයග්‍රහණය උදෙසා කැඳවීමටද මෙලොව හා පරලොවෙහි ඔවුන්ගේ යහපතද උදෙසාය. මේ සියල්ලෙහි ඔහුට සමානව කිසියම් දෙයක් නොමැත. අල්ලාහ් මෙසේ පවසයි:

﴿ اَللّٰهُ خَالِقُ كُلِّ شَيْءٍ وَّهُوَ عَلٰى كُلِّ شَيْءٍ وَّكِيْلٌ ﴾ الزمر : ٦٢

අල්ලාහ් සියලු දේ මවන්නාය. තවද, ඔහු සියලු දේ කෙරෙහි වගකිව යුත්තාය. (39:62)

අල් කුර්ආනයෙහි හා නබි තුමාගේ වැකියෙහි සඳහන් අල්ලාහ්ගේ අලංකාර නාමයන් හා ශ්‍රේෂ්ඨ ලක්ෂණයන්

කිසියම් වෙනස් කිරීමෙන්, වසංකිරීමෙන්, රූපකිරීමෙන් හා උදාහරණ කිරීමෙන් තොරව විශ්වාස කිරීමද අල්ලාහ් විශ්වාස කිරීමෙකි. ඒ සමගම, මෙම නාමයන් හා ලක්ෂණ යන් මැවීම්වලට මප්පු නොකර, ලක්ෂණ කිරීමට සුදුස්සා වන අල්ලාහ්ගේ මෙම නාමයන් හා ලක්ෂණයන් දැනුම් දෙන කරුණුද විශ්වාස කළ යුතුයි. අල්ලාහ් පවසයි:

﴿ لَيْسَ كَمِثْلِهِ شَيْءٌ ، وَهُوَ السَّمِيْعُ الْبَصِيْرُ ﴾ الشورى:١١

මහු හා සමාන කිසි දෙයක් නොමැත. මහු කන්දී නෙත් යොමා සිටින්නාය. (42:11)

## 2. මලාඉකාවරුන් විශ්වාස කිරීම

මලාඉකාවරුන් පිළිබඳ විශ්වාසය පොදුවෙන් හා පුළුල් වශයෙන් පවතී. එහෙයින්, මුස්ලිම් වරයෙකු අල්ලාහ් තආලාට මහු මවනලද මලාඉකාවරුන් සිටින බවත්, මවුන් නම අල්ලාහ් කෙරෙහි නැමදුමෙහි නිරතවී සිටින බවත් විශ්වාස කළ යුතුයි. මවුන් විවිධ කණ්ඩායම් වශයෙන් සිටිති. මවුන්ගෙන් අර්ෂය ඉසුලීම භාර අයද, ස්වර්ගය හා අපාය භාර අයද, දාසයන්ගේ ක්‍රියාවන් රකින අයද සිටිති. එසේම පුළුල් වශයෙන් අල්ලාහ් හා නබිතුමා නම් කළ අයද විශ්වාස කළ යුතුයි. මවුන් ජිබ්රීල්, මීකාඊල්, අපායේ භාරකරු මාලික්, සූර් පිඹීම භාර ඉස්රාෆීල් හා මෙවුන්නන්ය. නබි තුමා පැවැසූ බව ආයිෂා (රලි) තුමිය මෙසේ පවසන්නීය:

( خُلِقَتِ الْمَلَائِكَةُ مِنْ نُوْرٍ، وَخُلِقَ الْجَانُّ مِنْ مَارِجٍ مِّنْ نَارٍ، وَخُلِقَ آدَمُ مِمَّا وَصِفَ لَكَ ) رواه مسلم

මලා ඉකාවරුන් ආලෝකයෙන්ද, ජින්වරුන් දල්වන ගින්නෙන්ද, (නබි) ආදම් (ප්‍රථම මිනිසා) ඔබලාට වර්ණනා කළ දේයින්ද (පස්වලින්ද) මවනලද්දේය. (මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

### 3. වේද ග්‍රන්ථ විශ්වාස කිරීම

අල්ලාහ් තආලා තම යථාර්තය පැහැදිළි කිරීම හා ඔහු කරා කැඳවීම සඳහා ඔහුගේ නබි (වක්තෘ) වරුන්ට හා රසූල් (දූත) වරුන්ට වේද ග්‍රන්ථ පහළ කළ බව කෙටියෙන් (පොදුවෙන්) විශ්වාස කළ යුතුයි. ප්‍රථල් වශයෙන් තව්රාත්, ඉන්ජීල්, සබූර් හා කුරාන් යනුවෙන් අල්ලාහ් නම්කළ වේද ග්‍රන්ථයන් විශ්වාස කළ යුතුයි.

අල්කුරානය ඒවායින් ශ්‍රේෂ්ඨ හා අවසාන ග්‍රන්ථයෙකි. මෙය අනෙකුත් වේද ග්‍රන්ථ ආරක්ෂා හා සත්‍ය කරයි. මෙය සෑම මිනිස් සමාජයම පිළිපැදීමද නබිනායකතුමාගේ සුන්නා (හදීස්) නිවැරදි කළ දේ මගින් තීන්දු කිරීමද අනිවාර්යයි. කුමක්නිසාදයත්, අල්ලාහ් මුහම්මදු නබිතුමාව සියලු දෙවර්ගයන් (ජින් හා මිනිස්) කරා එව්වේය. තවද, මවුන් අතර තීන්දු කිරීම සඳහාද, මවුන්ගේ සිතෙහි දේ (රෝගය) ට ඖෂධය වශයෙන්ද, සියලු දේ පැහැදිළි කිරීමක් ලෙසද, සියලු ලොව වැසියන්ට යහමග හා කරුණාව වශයෙන්ද මෙම කුරානය ඔහුට පහළ කළාය. අල්ලාහ් මෙලෙස පවසයි:

﴿وَهَذَا كِتَابٌ أَنْزَلْنَاهُ مُبَارَكٌ فَاتَّبِعُوهُ وَاتَّقُوا لَعَلَّكُمْ تُرْحَمُونَ﴾ الأنعام: ١٥٥

(මනුෂ්‍යයෙනි,) මෙයද ධර්ම ග්‍රන්ථයෙකි. මෙය අපි පහල කළෙමු. මෙය ප්‍රසංසාලද ග්‍රන්ථයෙකි. එනිසා මෙය

පිළිපදින්න. තවද, ඔබලාට කරුණාව ලැබීම සඳහා ඔහුට බියවන්න. (6:155) තවද අල්ලාහ් පවසයි:

﴿ وَنَزَّلْنَا عَلَيْكَ الْكِتَابَ تِبْيَانًا لِّكُلِّ شَيْءٍ وَّهُدًى وَرَحْمَةً وَّبُشْرَى لِلْمُسْلِمِيْنَ﴾ النحل:٨٩

(නබිතුමනි) මෙම ග්‍රන්ථය සියලුදේ පැහැදිළි කිරීමක්, යහමග යොමු කිරීමක්, කරුණාව සැලසීමක් හා සුභාරංචි පැතීමක් වශයෙන් මුස්ලිම්වරුන්ට පහළ කළෙමු. (16:89)

## 4. රසූල්වරුන් (දූතයන්) විශ්වාස කිරීම

පොදුවෙත් හා පුළුල් වශයෙන් රසූල්වරුන් විශ්වාස කිරීම අවශ්‍යයයි. එනිසා, ඇත්ත වශයෙන්ම අල්ලාහ් තම දාසයන් වෙත සුභාරංචි පතන, අවවාද කරන, යථාර්තය කරා කැඳවන රසූල්වරුන් (දූතයන්) එවූ බව විශ්වාස කළ යුතුයි. එනිසා කවරෙකු ඔවුන්ට ඇහුම් කම් (උත්තර) දෙන්නේද ඔහු භාග්‍යවන්ත ජයග්‍රාහිකයාය. තවද, කවරෙකු හෝ ඔවුන්ට විරුද්ධවන්නේද ඔහු පරාජයට හා ශෝකයට පත්වන්නාය. ඔවුන්ගෙන් අවසාන හා ශ්‍රේෂ්ඨ වන්නා මුහම්මදු නබිතුමාය. අල්ලාහ් මෙසේ පවසයි:

﴿ وَلَقَدْ بَعَثْنَا فِيْ كُلِّ أُمَّةٍ رَّسُوْلاً أَنِ اعْبُدُوا اللهَ وَاجْتَنِبُوا الطَّاغُوْتَ ﴾

النحل:٣٦

සත්‍ය වශයෙන්ම, 'අල්ලාහ්ට වැඳුම් පිදුම් කරන්න, ශෛතානුන් (යක්ෂයන්) ගෙන් ඈත්වන්න.' යනුවෙන් දේශනා කිරීම සඳහා සෑම සමාජයක් කරාම අපි දූතයන් එව්වෙමු. (16:36) තවද අල්ලාහ් මෙසේ පවසයි:

﴿ مَاكَانَ مُحَمَّدٌ أَبَا أَحَدٍ مِّنْ رِّجَالِكُمْ وَلَكِنْ رَّسُوْلَ ا للهِ وَخَاتَمَ النَّبِيِّيْنَ﴾
الأحزاب: ٤٠

මුහම්මදු (තුමා) ඔබලාගේ කිසියම් පුරුෂයෙකුට හෝ පියෙකු ලෙස නොසිටියේය. එනමුත්, ඔහු අල්ලාහ්ගේ දූතයා හා අවසාන නබිවරයා වශයෙන් සිටියේය. (33:40)

පුළුල් වශයෙන් හා විශේෂයෙන් අල්ලාහ් හා නබිනායක තුමා නම් සඳහන් කළ රසූල්වරුන් (දූතයන්) විශ්වාසකළ යුතුයි. ඔවුහු නූහ්, හූද්, සාලිහ්, ඉබ්‍රාහීම් හා වෙනත් නබි වරුන්ය. එතුමන්ට හා නබි තුමාට අල්ලාහ්ගේ උතුම් සාමය හා සමාදානය ලැබෙතු මැන.

## 5. අවසාන දිනය විශ්වාස කිරීම

අල්ලාහ් තආලා හා නබිනායකතුමා පැවැසූ, මරණයෙන් පසු සිදුවන සියලු දේ කෙරෙහි විශ්වාස කිරීම මෙයට අදාලවේ. එනම්, මිනීවළෙහි නොසන්සුන්තාවය, එහි භාග්‍ය හා වේදනාව, පරලොවෙහි සිදුවන බියජනක හා අසීරු තාවය, සිරාත් පාලම, මීසාන් තරාදිය, ප්‍රශ්න කිරීම, ත්‍යාග පිරිනැමීම, මිනිසුන් අතර (කුසල් හා අකුසල් ක්‍රියා සඳහන්) පුස් කොලය බෙදීම, එය වම් අතින් ලබාගැනීම, දකුණ අතින් හෝ පිටුපසින් ලබාගැනීම යනාදිය විශ්වාස කළ යුතුයි.

තවද, නබිතුමාට දෙනු ලබන පොකුණ, ස්වර්ගය, අපාය, විශ්වාසවන්තයන් අල්ලාහ් තආලා බැහ දැකීම, ඔවුන් සමග අල්ලාහ් කතාකිරීම සහ කුරානය හා හදීසය මගින් ලැබු මෙවැනි වෙනත් දේ ගැන වශ්වාස කළ යුතුයි. තවද එය අල්ලාහ් හා නබිනායකතුමා පැහැදිලි කළ

අයුරින් තහවුරු කළ යුතුයි.

## 6. කළා හා කද්ර් (ඉරණම) විශ්වාස කිරීම

මෙම විශ්වාසය කරුණු හතරක් මත පවතී.

01. නිශ්චයෙන්ම, අල්ලාහ් පෙර සිදුවූ හා පසුව සිදුවන්නට යන දේද, තම දාසයන්ගේ ස්වභාවය, ආහාරය, ආයුෂ කාලය, ක්‍රියාව හා ඔවුන්ගේ වෙනත් කාර්යයන්ද දැන සිටින්නාය. ඔහුට කිසිදු දෙයක් සැඟවිය නොහැක. අල්ලාහ් පවසයි:

﴿ إِنَّ اللهَ بِكُلِّ شَيْءٍ عَلِيْمٌ ﴾ التوبة :١١٥

නිශ්චයවශයෙන්ම අල්ලාහ් සියලු දේම දැන සිටින්නාය (9:115)

02. ඔහු සැලසුම් කළ හා තීරණය කළ සියලු දේ ලිඛිතව තිබීම. අල්ලාහ් මෙසේ පවසයි:

﴿ وَكُلَّ شَيْءٍ أَحْصَيْنَاهُ فِيْ إِمَامٍ مُّبِيْنٍ ﴾ يس:١٢

තවද, සෑම දෙයක්ම අපි පැහැදිළි ග්‍රන්ථයෙහි ආරක්ෂා කොට තිබෙමු. (36:12)

03. ඔහුගේ පැවැතීමේ හැකියාව විශ්වාස කිරීම. එය ඔහු සිතන දේ සිදුවීම හා ඔහු නොසිතන දේ නොසිදුවීමය. අල්ලාහ් මෙසේ පවසයි:

﴿ كَذَالِكَ اللهُ يَفْعَلُ مَا يَشَاءُ ﴾ آل عمران : ٤٠

එසේම අල්ලාහ් තමා සිතන දේ කරන්නේය. (3:40)

04. ඔහු ලොවෙහි සියලු දේ මැවීම. ඔහු හැර මවන්නා හා පාලකයා නොමැත. අල්ලාහ් මෙලෙස පවසයි:

﴿ذَلِكُمُ اللهُ رَبُّكُمْ، لاَإِلَهَ إِلاَّ هُوَ، خَالِقُ كُلِّ شَيْءٍ فَاعْبُدُوْهُ، وَهُوَ عَلَى كُلِّ شَيْءٍ وَّكِيْلٌ﴾ الأنعام: ١٠٢

ඔහුතමා ඔබලාගේ අල්ලාහ්ය. ඔබලාගේ දෙවියාය. ඔහු හැර අන් කිසි දෙවියෙකු නොමැත. සැමදේ මවන්නා ඔහුය. එබැවින්, ඔහුටම අවනතවී වැඳුම් පිදුම් කරන්න. තවද, ඔහුතමා සැම කාර්යයන් නිරීක්ෂත කරන්නාය. (6:102

## ඉස්ලාමයෙන් පිටමංවන කරුණු

මුස්ලිම්වරයෙකු විවිධ ආකාරයෙන් තම ධර්මයේ සිට පිටත්වේ. එයින් ඉතා අනතුරු දායක හා අධික වශයෙන් සිදුවන දේ දහයක් තිබේ. ඒවා මෙසේය :

01. අල්ලාහ්ට ෂිර්ක් කිරීම. අල්ලාහ් පවසයි:

﴿إِنَّهُ مَنْ يُشْرِكْ بِاللهِ فَقَدْ حَرَّمَ اللهُ عَلَيْهِ الْجَنَّةَ وَمَأْوَاهُ النَّارُ، وَمَا لِلظَّالِمِيْنَ مِنْ أَنْصَارٍ﴾ المائدة:٧٢

කවරෙකු අල්ලාහ්ට සහකාරත්වය කරන්නේද, ඔහුට අල්ලාහ් ස්වර්ගය තහනම් කරයි. ඔහුට සුදුසු ස්ථානය අපායයි. අපරාධ කරන්නන්ට උපකාර කරන්නන් නොමැත. (5:72) මළ අයගෙන් ප්‍රාර්ථනා කිරීම, ඔවුන් මගින් සමාව අයැදීම, ඔවුන්ට භාර භාර ඔප්පු කිරීම, ඔවුන්ට නරබිල්ල දීම යනාදියද අල්ලාහ්ට ෂිර්ක් කිරීමෙකි.

02. තමා හා අල්ලාහ් අතර තැරව කරුවන් ඇති කිරීම. මෙසේ තැරව කරුවන් ඇතිකර, ඔවුන්ගෙන් ප්‍රාර්ථනා කරන්නා, ඔවුන්ගෙන් නිර්දේශ (රැකමදාරු) පතන්නා,

මවුන් වෙත තම කාර්යයන් පවරන්නා කාෆිර්ය.

03. (අල්ලාහ්ට හවුල්කාරත්වය කරන) මුෂ්රික්වරුන්, (ප්‍රතික්ෂේප කරන) කාෆිර් නොකරන්නා හෝ මවුන්ගේ කුෆ්ර් හි සැක නොකරන්නා හෝ මවුන්ගේ මාර්ගය නිවැරදි කරන්නා කාෆිර්ය.

04. නබි නායකතුමාගේ (යහ) මගට වඩා අන් අයගේ මාර්ගයන් ඉමහත් සම්පූර්ණ බව හෝ එතුමාගේ අණ පණත්වලට වඩා අන් අයගේ අණපණත් යහපත් බව නිශ්චය කරන්නා කාෆිර්ය. මෙය මිනිසුන් ඇතිකර ගන්නා නීති රීති හා විධිවිධාන ඉස්ලාමීය ෂරීආවට වඩා ශ්‍රේෂ්ඨ බව හෝ ඉස්ලාම් හි නීතිරීතියන් මෙම කාලයට උචිත නොවන බව හෝ මුස්ලිම්වරුන්ගේ නොදියුණුවට මෙය හේතුවන බව හෝ ජීවිතයේ අනෙකුත් අංගයන් හැර තමා දෙවියන් පිළිබඳ සම්බන්ධ තාවය පමණක් සීමා කිරීම හෝ සොරාගේ අත කැපීම, ගණිකා වෘත්තියේ යෙදෙන විවාහකයන් ගල් ගසා මැරීම යන අල්ලාහ්ගේ නීතියන් ක්‍රියා කිරීම කාලයට නොමබින බව හෝ සිතීමට සමානය.

එසේම, ෂරීආවෙ නීතිරීති අන් නීතිරීතිවලට වඩා ශ්‍රේෂ්ඨ බව නිශ්චය කළත්, ගනුදෙනු කිරීම හෝ දඬුවම් පමුණුවීම යනාදියෙහි අල්ලාගේ ෂරීආ නොවන නීතිරීති වලංගු බව නිශ්චය කිරීමද මෙහි ඇතුලත්වේ. කුමක්නිසාදයත්, මෙය අල්ලාහ් අවලංගු කළ දේ වලංගු කිරීමකි. අල්ලාහ් අවලාංගු කළ දේ වලංගු කරන්නන් සැම දෙනා කාෆිර්ය.

05. නබිනායක තුමා ගෙන ආ දේ අප්‍රිය කිරීම, මහු එය ක්‍රියා කළත් කාෆිර්ය. අල්ලාහ් පවසයි:

﴿ ذَلِكَ بِأَنَّهُمْ كَرِهُوْا مَا أَنْزَلَ اللهُ فَأَحْبَطَ أَعْمَالَهُمْ ﴾ محمد:٩

කුමක්නිසාදයත්, අල්ලාහ් පහළකළ (වේද ග්‍රන්ථයෙහි) දේ ඔවුන් අප්‍රිය කළහ. එනිසා ඔවුන්ගේ ක්‍රියා සියල්ලම ඔහු නිශ්ඵල කළාය. (47:9)

06. නබිනායක තුමාගේ දහමෙහි යම් දෙයක් හෝ එහි ත්‍යාග හෝ දඬුවම විහිළු කිරීම. එය කුෆ්ර් කිරීමෙකි. අල්ලාහ් මෙලෙස පවසයි:

﴿ قُلْ أَبِا للهِ وَآيَاتِهِ وَرَسُوْلِهِ كُنْتُمْ تَسْتَهْزِؤُوْنَ، لاَتَعْتَذِرُوْا قَدْ كَفَرْتُمْ بَعْدَ إِيْمَانِكُمْ ﴾ التوبة:٦٦،٦٥

(නබිතුමනි) ඔබලා අල්ලාහ් තආලාද, ඔහුගේ වැකියන්ද, ඔහුගේ දූතවරයාද විහිළු කරමින් සිටියේ? යනු වෙන් ඔබ අසන්න. (ඔබලා) ව්‍යාජ කරුණු නොකියන්න. නියතවශයෙන්ම, ඔබලා විශ්වාස කළායින් පසු ප්‍රතික්ෂේප කළෝය. (9:65,66)

07. හූනියම් කිරීම. කවරෙකු හූනියම් කරන්නේද හෝ එය පිළිගන්නේද ඔහු කාෆිර්ය. අල්ලාහ් මෙසේ පවසයි:

﴿ وَمَايُعَلِّمَانِ مِنْ أَحَدٍ حَتَّى يَقُوْلاَ إِنَّمَا نَحْنُ فِتْنَةٌ فَلاَ تَكْفُرْ ﴾ البقرة :١٠٢

නිශ්චයෙන්ම අපි වේදනාවෙහි (සන්සුන්තාවයෙහි) පසු වෙන්නෙමු. එම නිසා (මෙය ඉගෙන ගෙන) කාෆිර් නොවන මෙන් අවවාද කරන තෙක් කවරෙකුට හෝ මෙම හූනියම උගැන්වූයේ නැත. (2:102)

08. මුෂ්රික්වරුන්ට උපකාර කිරීම හා මුස්ලිම්වරුන්ට එරෙහිව ඔවුන්ට සහාය වීම. අල්ලාහ් පවසයි:

﴿ وَمَنْ يَتَوَلَّهُمْ مِنْكُمْ فَإِنَّهُ مِنْهُمْ، إِنَّ اللهَ لاَ يَهْدِي الْقَوْمَ الظَّالِمِيْنَ ﴾

المائدة: ٥١

ඔබෙන් කවරෙකු හෝ ඔවුන් (යුදෙව් හා කිතු බැතිමතුන්) භාරකරුවන් ලෙස පිළිගන්නේද, නියත වශයෙන්ම ඔහු ඔවුන්ගේම අයෙකි. නිශ්චයෙන්ම අල්ලාහ් අපරාධකාර සමාජයට යහ මග නොපෙන්වයි. (5:51)

09. සමහර මිනිසුන් නබිනායක තුමාගේ ෂරීආවෙන් (මග) පිටවිය හැකි බව නිශ්චය කිරීම. එසේ කරන්නා කාෆිර්ය. අල්ලාහ් මෙසේ පවසයි:

﴿ وَمَنْ يَبْتَغِ غَيْرَ الْإِ سْلاَمِ دِيْنًا فَلَنْ يُقْبَلَ مِنْهُ، وَهُوَ فِي الْآخِرَةِ مِنَ الْخَاسِرِيْنَ ﴾ آل عمران: ٨٥

තවද, කවරෙකු ඉස්ලාම් හැර (අන්) ධර්මයන් ප්‍රිය කරන්නේද එය පිළි නොගැනේ. තවද, ඔහු අවසාන දිනයෙහි අලාභයට පත්වූ අය අතර සිටී. (3:85) නබි නායක තුමාගේ සංදේශය කවරෙකුට ලැබෙන්නේද ඔහුට එය හැර අන් කිසියම් මගක් පිළිපැදීම හෝ එතුමාගේ මග හැර අන් මගක් පිළිපැදීමෙන් ඔහුට ජයක් ලැබේ යයි නිශ්චය කිරීම හෝ කළ නොහැක.

10. අල්ලාහ්ගේ ධර්මය උදාසීන කිරීම. එය ඉගෙන නොගැනීම හා එය ක්‍රියා නොකිරීම. අල්ලාහ් මෙලෙස පවසයි:

﴿ وَمَنْ أَظْلَمُ مِمَّنْ ذُكِّرَ بِآيَاتِ رَبِّهِ ثُمَّ أَعْرَضَ عَنْهَا، إِنَّا مِنَ الْمُجْرِمِيْنَ مُنْتَقِمُوْنَ ﴾ السجدة: ٢٢

තවද, කවරෙකු තම දෙවියාගේ වැකියන් සිහිකර දීමෙන් පසු එය ප්‍රතික්ෂේප කරන්නේද, ඔහුට වඩා මහත් අපරාධ කරුවන් සිටින්නේද.? නියත වශයෙන්ම (මෙම) අපරාධ කරුවන්ට දඬුවම් දෙන්නෙමු. (32:22)

මෙය, මුස්ලිම්වරයෙකු වීමට අවශ්‍ය ධර්මයේ මූලිකයන් ඉගෙන ගැනීම උදාසීන කිරීමයි. ධර්මය පුළුල් වශයෙන් ඉගෙන ගැනීම මෙහි අරමුණ නොවේ. තවද, බලහත්කාරකමට ලක්වූවන් හැර මිතැකමින් කරන්නා හා විහිළුකාරයා අතර කිසියම් වෙනසක් නොමැත. මෙහිදී බලහත්කාරකමට ලක්වූ අය ගැන ප්‍රශ්නයක් නොමැත.

والله أعلم، وصلى الله على نبينا محمد وعلى آله وصحبه وسلم،

والحمد لله رب العالمين.

سنهالي

# أصول العقيدة

ردمك ٩ ٦٤ ٨٣٠ ٩٩٦٠

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
هاتف [illegible] ناسوخ [illegible] ص.ب [illegible] الرياض [illegible] بريد إلكتروني E.mail: Sultanah23@hotmail.com
شركة الراجحي المصرفية حساب رقم ١٩٥٠٢١٠٠٠٨